# ලංකාවේ සමාජ ව්‍යුහයට අරක්කු රේන්ද ක්‍රමය තුළින් ඇති වූ බලපෑම

***ඩබ්. වයි. එම් සිරිවර්ධන*** [1]

***කේ. එම්. පී කුලසේකර*** [2]

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

සංක්ෂේපය

1833 දී ඇති වූ කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණවලින් අනතුරුව ආරම්භ වූ වතු ආර්ථිකයේ වර්ධනය හේතු කොට ගෙන බ්‍රිතාන්‍යයන් යටතේ මෙරට ආර්ථිකයේ වැදගත් සන්දිස්ථානයක් සලකුණු විය. මෙහි ප්‍රතිඵලය වූයේ 1833 න් පසුව ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය නිර්බාධවාදී ආර්ථිකයක් වර්ධනය වීම හා ධනේශ්වර ආර්ථිකයක් වර්ධනය වීමට ඉඩ ප්‍රස්තාව සැලසීමයි. එහිදී වතු ආර්ථිකය සීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම හා ඊට සාපේක්ෂව ප්‍රවාහන පහසුකම් වර්ධනය වීම හේතු කොට ගෙන ස්වදේශිකයන් හට නව වාණිජ කටයුතු සඳහා ඉඩ ප්‍රස්තාව ලැබිණි. වතුවල වැඩ කළ කම්කරුවන් සංඛ්‍යාව වැඩි වීමත් මහා මාර්ග හා දුම්රිය මාර්ග ඉදිකිරීමේ කම්කරුවන් සංඛ්‍යාව වැඩි වීමත් හේතු කොට ගෙන අරක්කු සඳහා ඉල්ලුම වැඩි විය. මේ අනුව මේ කාලපරිච්ඡේදය වන විට දේශීය ප්‍රාග්ධන සමුච්චයේ වැදගත් උල්පත අරක්කු රේන්ද ක්‍රමය විය. ඒ අනුව ලංකාවේ සමාජ ව්‍යුහයට අරක්කු රේන්ද ක්‍රමය තුළින් ඇති වූ බලපෑම විමසා බැලීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ ය.

මෙම පර්යේෂණයේ දී මා අධ්‍යයනය කරනු ලබන්නේ අරක්කු රේන්ද ක්‍රමය මෙරට ධනේශ්වර පන්තියේ නැගීම සඳහා හේතු වූවා ද? ඒ කෙසේද ? යන ගැටලුව යි. ඒ සඳහා බ්‍රිතාන්‍යය පාලන යුගයේ 1833 සිට 1935 දක්වා ක්ෂෙත්‍රය විමසීමට ලක් කෙරේ. ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය භාවිත කරමින් මෙම පර්යේෂණය සිදු කිරීමට අපේක්ෂිතය. මෙහි දී සොක්කන් ලොක්කන් වූ වගයි පර්යේෂණ ග්‍රන්ථය හා බ්‍රිතාන්‍යය යටත්විජිත යුගයේ ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය ග්‍රන්ථය පෙර පර්යේෂණ වශයෙන් වැදගත් වේ. මේ අනුව අරක්කු රේන්දය තුළින් විශාල ප්‍රාග්ධනයක් ඒකරාශී කොට ගෙන අරක්කු වෙළෙඳාමේ ආධිපත්‍යය පතුරුවා ගනිමින් ප්‍රාග්ධන සමුච්චය තර කර ගැනීමට සමත් වූ පුද්ගලයන්ගෙන් සැදුම්ලත් පුද්ගල කොට්ඨාසයක් ලංකාවේ සමාජ ව්‍යුහය වෙනසකට ලක් කරමින් ධනේශ්වර සමාජ ක්‍රමයේ එක් කොට්ඨාසයක් බවට පරිවර්තනය වූවා යැයි උපකල්පනය කළ හැකි ය.

ප්‍රමුඛ පද- ආර්ථිකය, අරක්කු රේන්ද ක්‍රමය, ධනේශ්වර

---

*1. ඉතිහාසඥය, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*
yehenimadubashini06@gmail.com

*2. මහාචාර්ය,ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*